## රාජ්‍ය දැව සංස්ථාව

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

**තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය දැව සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 21 හි නියමයන් ප්‍රකාරව අනේවාසික විදේශ මුදල් ගිණුමෙහි විදේශ විනිමය අනුපාතයේ ශුද්ධ වෙනස වූ රු.492,868 ක මුදල ආදායම් ප්‍රකාශයේ වෙන්ව දැක්විය යුතු වුවද එසේ නොදක්වා එය ආදායම් ප්‍රකාශයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණි.

#### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති

සංස්ථාවේ සියළුම අංශවලට සේවා සපයන යාන්ත්‍රික වැඩපළට අදාල මුළු වියදම වූ රු. 27,362,375 ක් මුදල අදාල සේවාවන් ලබා ගන්නා ලද අංශ අතර විභජනය කරනු වෙනුවට විකුණුම් පිරිවැය ලෙස දක්වා තිබුණි.

#### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ**

(අ) ගෘහ භාණ්ඩ අංශයේ වර්ෂයේ ආරම්භක හා අවසාන අමුද්‍රව්‍ය තොග සහ නිමි භාණ්ඩ තොග වෙන් වෙන්ව දක්වා නොතිබූ අතර ඒ හේතුකොටගෙන නිෂ්පාදනය කරන ලද ගෘහ භාණ්ඩ වල නිෂ්පාදන පිරිවැය වෙන්ව හඳුනා ගත නොහැකි විය.

(ආ) ආර්ථික සේවා ගාස්තු ගිණුම් ගත කිරීමේදී 2010 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව ගෙවන ලද මුදල 2011 වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු ලෙස සැලකීමත් 2011 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාලයට අදාලව ගෙවිය යුතුවූ රු. 8,110,676 ක් වූ ආර්ථික සේවා ගාස්තු බදු මුදල 2011 වර්ෂයට ගෙවිය යුතු මුදලක් ලෙස ගිණුම් වල දක්වා නොතිබීමෙන් රු.178,846 ක මුදලක් ආර්ථික සේවා ගාස්තු අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ යතුරුපැදි අපහරණය තුළින් ලැබී තිබු රු. 205,594 ක මුදල වත්කම් අපහරණ ගිණුමට බැර කරනු වෙනුවට විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි.

(ඈ) සංස්ථා නිලධාරින්ගෙන් අයකරගත් රු. 286,934 ක දඩමුදල් ගෙවියයුතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුලදී බාහිර ආයතන වලින් ලැබී තිබු රු. 17,724,680ක අත්තිකාරම් මුදල ණයගැති ශේෂයෙන් අඩුකර දක්වා තිබු හෙයින් ජංගම වත්කම් හා ජංගම බැරකම් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.2.4 ලැබියයුතු ගිණුම් හා ගෙවිය යුත ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ණයගැතියන්**

(i) පෞද්ගලික සමාගමකින් 1983 වර්ෂයේ සිට අයවිය යුතුව තිබුණු රු. 11,873,865 ක් වු ණය ශේෂය ලියාහැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීම සම්බන්ධයෙන් කටයුතු කරන බව සභාපතිවරයා විසින් දන්වා තිබුණද එම අනුමැතිය සමාලෝචිත වර්ෂය අවසානය තෙක් ලැබී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයට අදාලව අවුරුදු 05 ට වැඩි ණයගැති ශේෂය රු.13,871,024ක් විය.

(iii) 2008, 2009 සහ 2010 වර්ෂ වලදී බාහිර ආයතන වෙත ලබාදී තිබු පිළිවෙලින් රු.705,458 , රු.77,138 සහ රු. 15,895 අත්තිකාරම් 2011 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි.

**(ආ) ණය හිමියන්**

ආපසු ගෙවියයුතු ටෙන්ඩර් තැන්පතු යටතේ දක්වා තිබු අවුරුදු 2 සිට 5 දක්වා වු රු.107,750 ක් වටිනා ණයහිමි ශේෂයන් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

2011දෙසැම්බර් 31 දිනට කෙරගෙන යන වැඩ ගිණුමෙහ රු 12,832,130 ක් වූ ගිණුම් ශේෂය සඳහා අදාල උපලේඛන විගණනයට ඉදිරිපත් නොවූයෙන් එම ශේෂය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

### 1.2.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 8 (2) වගන්තිය | රුපියල් පන්ලක්ෂයකට වැඩිවන මූලධන වියදම් සඳහා මුදල් ඇමතිවරයාගේ සහ ක්‍රම සම්පාදන ඇමතිවරයාගේ එකඟත්වය සහිතව අදාල ඇමතිවරයාගේ අනුමැතිය ලබාගතයුතු වුවද කල්දෙමුල්ල සංකීර්ණයේ රු.12,724,917 ක් වටිනා වානේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ගිවිසුම් ඇතිකරගෙන තිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 4.2.5. වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස පහත සඳහන් ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුත වුවද ඒ අනුව කටයුතු කර නොතිබණි.<br>(අ) ණයගැති , ණයහිමි කාලවිශ්ලේෂණ<br>(ආ) තොග කාල විශ්ලේෂණ<br>(ඇ) පැරණි, යල්පැන ගිය හා සෙමින් චලනය වන තොග හා වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශන. |

### 1.2.7 අවිධිමත් ගණුදෙනු

ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබීමට පෙර 2009 වාර්ෂික වාර්තාව මුද්‍රණය කිරීම සඳහා රු.570,914ක ටෙන්ඩරයට සැපයුම්කරු සමඟ සාමාන්‍යාධිකාරී 2011 ජුනි 21 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණේ 2011 ජුනි 23වන දිනදීය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය ආදායම් බදු ගණන් ගැනීමට පෙර රු.603,498,864 ක ශුද්ධ ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී ආදායම් බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය රු.877,623,257 ක් වූයෙන් රු.274,124,393 ක ශුද්ධ ලාභයේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සංස්ථාවේ මූලික මෙහෙයුම් වලින් රු.444,444,459 ක ලාභයක් උපයා තිබුණි. මෙය ඉකුත් වර්ෂයේ මූලික මෙහෙයුම් ප්‍රතිඵලය වූ රු.615,230,379 සමඟ සැසඳීමේදී රු.170,785,920 ක අඩුවීමකි. මෙම ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණේ වර්ෂයේ විකුණුම් රු.440,312,420 කින් අඩු වීම සහ විකුණුම් හා බෙදාහැරීම් වියදම් රු.61,662,903 කින් වැඩිවීමයි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ දල ලාභ ප්‍රතිශතය 42.86% ක්ද හා බදු වලට පෙර ශුද්ධ ලාභ ප්‍රතිශතය 18.49% ක්ද වූ අතර ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ දල ලාභ ප්‍රතිශතය 41.39% ක් හා බදු වලට පෙර ශුද්ධ ලාභ ප්‍රතිශතය 14.07% ක් විය. මේ අනුව දල ලාභ ප්‍රතිශතයෙහි 1.47% ක අඩුවීමක් මෙන්ම ශුද්ධ ලාභ ප්‍රතිශතයෙහි 4.42% ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙසේ ශුද්ධ ලාභය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පෙර වර්ෂයට සාපේක්ෂව විකණුම් 13.35% ක් අඩුවීමක් හා ආයතන, විකුණුම් හා බෙදාහැරීම් වියදම් 7.65% කින් වැඩිවීමයි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| <u>ද්‍රවශීලතා අනුපාතය</u> | <u>සම්මත අනුපාත</u> | <u>2011</u> | <u>2010</u> | <u>2009</u> |
|---|---|---|---|---|
| ජංගම අනුපාත | 2:1 | 2.93:1 | 2.26:1 | 2.02:1 |
| ක්ෂණික වත්කම් අනුපාත | 1:1 | 1.8:1 | 1.71:1 | 1.35:1 |

සංස්ථාවේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාත ක්‍රමාණුකූලව වැඩිවී ඇති හෙයින් අතිරික්ත කාරක ප්‍රාග්ධන තත්ත්වයක් පවතී.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

**(අ) ඉරූ දැව ආනයනය**

ඉරූ දැව ඝණ මීටර් 5,000 ක් ආනයනය කිරීමට ද ඒ යටතේ රු. මිලියන 487.5ක ආදායමක් ලබාගැනීමටද සංස්ථාව සැලසුම් කර තිබුණ නමුත් 2011 වර්ෂයේදී දැව ආනයනය කර නොතිබුණි.

**(ආ) ගෘහ භාණ්ඩ ඒකකය**

(i). මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ තථ්‍ය ගෘහභාණ්ඩ අලෙවිය රු.මිලියන 121.74 ක්වූ අතර , එය රු. මිලියන 203.12 ක්වූ අයවැයගත විකුණුම්වලට වඩා රු.මිලියන 81.38 ක අඩුවීමකි. සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ ගෘහභාණ්ඩ ඒකකයේ වූ අලාභය රු. මිලියන 34.22 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව නිෂ්පාදන පිරිවැය 46.53 % කින් වැඩි වීම හා ආයතන හා පරිපාලන වියදම් 30 % කින් වැඩි වීම යන හේතූන් නිසා මෙම ඒකකයේ අලාභයක් ඇති වී තිබුණි.

(ii). දැව සංස්ථාවේ සංයුක්ත සැලැස්ම අනුව ගෘහ භාණ්ඩ අංශයේ අලෙවි ආදායම 2010 වර්ෂයේ රුපියල් මිලියන 180 ක් හා 2011 වර්ෂයේ රුපියල් මිලියන 190 කින් හා 2012 වර්ෂයේදී රුපියල් මිලියන 200 කින් ඉහළ දැමීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද සමාලොචිත වර්ෂයේ තථ්‍ය ගෘහභාණ්ඩ අලෙවිය රු. මිලි. 121.74 ක් වූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ගෘහභාණ්ඩ අලෙවියෙහි 83.35% ක වර්ධනයක් සිදුවී තිබුණද සංයුක්ත සැලැස්ම අනුව අපේක්ෂිත අලෙවි ඉලක්කයන් කරා ළඟාවීමට නොහැකිවී තිබුණි.

(iii). 2011 වර්ෂයේ සංස්ථාවේ ගෘහභාණ්ඩ අලෙවිය ප්‍රවර්ධනය සඳහා සාර්ථක වැඩපිළිවෙලක් දියත් කර නොතිබුණි.

(ඇ) ආයතනයේ අරමුණු වල ඇතුලත්කර තිබුණු කෘෂිකාර්මික නිෂ්පාදන, වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන පිරිසැකසුම් සහ වේවැල් ආනයනය කිරීම දැව වලින් අතුරු නිෂපාදන නිපදවීම හා අලෙවිය හා දැවමය නිමි භාණ්ඩ හා අර්ධ නිමි භාණ්ඩ අපනයනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු පියවරක් ගෙන නොතිබුණි. මේවා නිෂ්පාදනය ලාභ දායිත්වය සම්බන්ධයෙන් අවාසි සහගත නිසා මේ සඳහා සංස්ථාව යොමු නොවු බව සභාපති වරයා දැනුම් දී ඇත.

**(ඇ) දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන**

---

සමාලෝචිත වර්ෂයේ තථ්‍ය නිෂ්පාදනය, අය වැය ගත නිෂ්පාදනය සමග සැසඳීමේදී ඉරූ දැව, සිල්පර, බිත්ති පනේල හා ගෘහභාණ්ඩ සම්බන්ධයෙන් වු තත්‍ය නිෂ්පාදනයෙහි අඩුවීම පිළිවෙලින් 64.5% , 48.45%, 92.36%, හා 29.85% ක මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

**පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.**

(අ) තෙල් කැවීම් හා පදම් කිරීමේ අංශයේ ප්‍රතික්ෂේපිත සිල්පර විකුණුම් වටිනාකම රු.8,957,819 ක් වු අතර මෙය 2010 වර්ෂයේ රු. 3,970,334 විකුණුම් වලට සාපේක්ෂව 225.6% ක වැඩිවීමකි. මේ අනුව සැලකිය යුතු වටිනාකමකින් යුත් සිල්පර තොගයක් ප්‍රතික්ෂේපවී තිබුණි.

(ආ) සංස්ථාව විසින් ගිණුම් හා මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරනු ලබන Accpac ගිණුම්කරණ තොරතුරු පද්ධතිය 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා භාවිතා කරනු ලබන අතර පද්ධතිය හඳුන්වාදුන් දින සිට 2011 දෙසැම්බර් 31 දක්වා අඩුපාඩුකම් පැවති බව නිරීක්ෂණය වූ අතර නිසි ගිණුම්කරණ තොරතුරු පද්ධතියක් නොමැති වීම නිසා අවසාන ගිණුම් සකස් කිරීමේ ප්‍රමාදයන් පවතින බවද නිරීක්ෂණය විය.

**(ඇ)** තිරසාර වන කළමනාකරණ අත්පොත දින 30 ක් ඇතුළත සැපයිය යුතු වුවද මාස 07 කට වැඩි කාලයක් ගතව තිබුණු බැවින් මෙම පොත එළිදැක්වීමට බලාපොරොත්තු වූ ඔක්තෝබර් 15 දිනට යෙදුන හරිත මාසයේදී එළිදැක්වීමට නොහැකි වී තිබුණි.

**(ඈ)** අධිකරණ නියෝගයකට පටහැනිව ක්‍රියා කිරීම හේතු කොටගෙන සභාපතිවරයාට නිකුත් කරන ලද සිතාසියක් සම්බන්ධයෙන් නීති කටයුතු කිරීම සඳහා නීතිඥවරයෙකුට රු. 300,000 ක් ගෙවා තිබුණි.

**(ඉ)** තවද රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් අදාල නීතිරීති අනුගමනය නොකිරීම නිසා රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා තිබූ අංක SC/FR/567/2010 නඩුව සඳහා රු. 275,000 ක නීතිඥ ගාස්තු ගෙවා තිබූ අතර, බේරුම්කරුවකුගේ තීරණයන් පරදී කටයුතු නොකිරීම සම්බන්ධව කම්කරු කොමසාරිස් විසින් සංස්ථාවට එරෙහිව පැවරූ නඩුවක් වෙනුවෙන් නීතිඥයෙකු ඉදිරිපත් කර රු.52,030 ක මුදලක් ගෙවා තිබුණි.

## 3.3 ආර්ථික නොවූ ගණුදෙන

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වසරේ ඉන්දියානු සමාගමකින් ප්‍රමිතයෙන් තොර ක්‍රියෝෂෝට් ආනයනය කර භාවිතා කිරීම නිසා රු. 6,266,409ක අලාභයක් සිදුවී තිබුණි. ඒ පිළිබඳව අවසන් එකඟතාවයකට නොපැමිණ අදාල සමාගමට රු.4,256,977 (ඇ.ඩො. 37,497.49)ක් ගෙවා තිබුණු අතර තවදුරටත් ඇ.ඩො. 54,490 ක මුදලක් සඳහා ලබාගෙන තිබූ ණයවර ලිපි සම්බන්ධව මෙතෙක් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වඩු කාර්මිකයින් 40 ක් , ඔප දමන්නන් 20 ක් , පින්තාරු කරුවන් 03 ක් සේවයේ නියුතු වුවත් රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ සම්මන්ත්‍රණ ශාලා පුටු 63 ක් ස්ප්‍රේ කිරීම සඳහා එක් පුටුවකට රු. 3,150 බැගින් රු. 194,450 ක් ගෙවා තිබුණි. පොලියුරතීන් කිරීම සඳහා පළපුරුදු සේවකයන් සංස්ථාවේ නොමැති බැවින් බාහිරින් කරවා ගැනීමට සිදුවූ බව සභාපතිවරයා දන්වා තිබුණි.

## 3.4 වාහන පරිපාලනයේ දුර්වලතා

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ).** කැබ් රථයක් අවස්ථා 4 කදී හදිසි අනතුරුවලට ලක්වීතිබූ අතර රක්ෂණයෙන් ආවරණය නොවූ පාඩුව රු. 162,323 කි. අනතුරුවලට ලක්වුවද වගකිවයුතු සේවකයන් සම්බන්ධයෙන් සංස්ථාව පරීක්ෂණයන් පවත්වා නොතිබුණි. එමෙන්ම අනතුරු පිළිබඳව පොලිසිය මගින් ගත් ක්‍රියා මාර්ග පිළිබඳව පසු විපරම් කර නොතිබුණි.

**(ආ).** සංස්ථාවේ නිලධාරියකු නොවන ක්‍රියාකාර අධ්‍යක්ෂ වරයා විසින් වාහනය පදවන අවස්ථාවකදී රු. 1,258,551 ක අලාභයක් වාහනයට සිදුකරමින් අනතුරට ලක්ව ඇති

අතර මේ සම්බන්ධව සංස්ථාව විසින් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. මු.රෙ. 104 ට අනුව කමිටුවක් පත්කර ඇති බවත් වාර්තා ලැබුණු පසු අවශ්‍ය පියවර ගන්නා බවත් සභාපතිවරයා දන්වා ඇත.

**(ඇ).** 2010 අගෝස්තු 24 දින කැබ් රථයකට සිදුවූ අනතුරෙන් රු.7,684,456 ක් වටිනා රථය සම්පූර්ණයෙන් අලාභ වී තිබූ අතර, සංස්ථාව පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. තවද වාහනයේ අනතුර වලක්වා ගැනීමට නොහැකි වීම පිළිබඳව අදාල රියදුරු සම්බන්ධයෙන් විනය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

**(ඈ).** කැබ් රථයක් 2010 අප්‍රේල් 30 දින අනතුරට ලක්ව ඇති අතර වාහන අළුත්වැඩියාවට යන වියදම රක්ෂිත වටිනාකමින් 50% ක් ඉක්මවා එනම් රු. ලක්ෂ 8 ත් ඉක්මවන බැවින් වාහනය ගර්හිත කිරීමට ජාතික රක්ෂණ භාර අරමුදල 2011 අගෝස්තු 11 දින තීරණය කර තිබුණි. ඒ පිළිබඳ මේ දක්වා කිසිදු පරීක්ෂණයක් කර නොතිබුණි.

## 3.5 බාහිර පාර්ශවයන් වෙත ලබා දී ඇති සංස්ථාවේ සම්පත්

2008 වර්ෂයට පෙර සිටම බාහිර පාර්ශවයක් විසින් ප්‍රයෝජනයට ගත් ජීප් රථයක රක්ෂණ වියදම රු. 83,517 ක් රාජ්‍ය දැව සංස්ථාව විසින් දරා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008-2012 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළයෙල කර තිබුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2008-2012 කාලපරිච්ඡේදයට අදාල සංයුක්ත සැලැස්මෙහි පිටපත් මුල්‍ය වර්ෂය ආරම්භවීමට අඩුතරමින් දින 15 කට ප්‍රථමව රේඛීය අමාත්‍යංශයට, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවේ. නමුත් සංස්ථාව විසින් 2010-2014 කාලපරිච්ඡේදයට අදාලව යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්මක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) උපක්‍රමික සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය සඳහා අපේක්ෂිත නිෂ්පාදන සහ ආනයනවල ප්‍රගතිය පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| අරමුණ හා වැඩසටහන | උපක්‍රමික සැලැස්ම අනුව අපේක්ෂිත ප්‍රමාණය | කාර්තුමය වාර්තා අනුව තථ්‍ය ප්‍රමාණය | වෙනස | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 4. 1 ඉරුං දැව නිෂ්පාදනය | ඝ. මී 6000 | ඝ.මී. 3,753 | 2,247 | (37.45) |
| 4.2 ඉරුං දැව ආනයනය | ඝ.මී. 5,000 | - | ඝ.මී. 5,000 | (100.0) |
| 5.1 සිල්පර නිෂ්පාදනය | ඒකක 120,000 | 66,699 | 53,301 | (44.4) |
| 5.1 සිල්පර ආනයනය | ඒකක 30,000 | | 30,000 | (100.0) |
| 5.2 සම්ප්‍රේෂණ කනු නිෂ්පාදනය | ඒකක 60,000 | 31,863 | 28,137 | (46.9) |
| 01.1 සාම්ප්‍රදායික ගෘහභාණ්ඩ නිෂ්පාදනය | රු.මි. 36 | | | |
| 1.3 කල්දෙමුල්ල, අම්පාර, බුස්ස සංකීර්ණ වල නිෂ්පාදනය වැඩි කිරීම | රු.මි. 120 | 140 | 198 | (58.5) |
| 3.1 ගෘහ භාණ්ඩ කොටස් නිෂ්පාදනය | රු.මි. 7 | | | |
| 7.2 ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර පිහිටුවීමෙන් පිරිවැටුම වැඩි කිරීම | රු.මි. 175 | | | |

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2011 වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාර සැලස්මක් පිළියෙළ කර තිබුණද එහි පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දැව නිෂ්පාදනය හා විකිණීම පමණක් අරමුණු කරගෙන ක්‍රියාකාර සැලැස්ම පිලියෙල කර තිබුණු අතර සංස්ථාවේ සියලු අංශ පිළිබඳව අවධානය යොමුකර එය පිලියෙල කිරීම කෙරෙහි සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ආ) අදාල වර්ෂය තුළදී ආයතනයේ අරමුණු හා ඉලක්ක සපුරා ගැනීමට වගකීම් පවරා ඇති නිලධාරීන් නිශ්චිතව දක්වා තිබිය යුතු වුවද 2011 ක්‍රියාකාර සැලැස්මෙහි එසේ හඳුනාගෙන නොතිබුණි.

## 4.3 අභ්‍යන්තර විගණනය

පහත කරුණු අනාවරණය විය.

(අ) මු.රෙ. 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති එවිය යුතු වුවත් කිසිදු අභ්‍යන්තර විගණන වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වෘත්තීය සුදුසුකම් ලත් ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළු විගණන නිලධාරීන් 54 දෙනෙකුගෙන් අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය සමන්විත වුවද අභ්‍යන්තර පාලන පද්ධතීන් නියාමනය කර ඒවා වැඩි දියුණු කිරීමට නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. තවද ඒ වෙනුවට ප්‍රාදේශීය කාර්යාල වලට නිලධාරීන් අනුයුක්ත කර විගණන නොවන රාජකාරි වලටද යොදවා තිබුණි.

(ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5) (ඕ) වගන්තිය ප්‍රකාර අර්ධ වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 4.4 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වසර සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.5 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයෙහි අය වැය ගත ආදායම්/වියදම්, තථ්‍ය ආදායම්/වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විචලනය සෘණ 100% සිට සෘණ 39.98% ක සහ වියදම් විචලනය 0.12% සිට 686.55% ක් දක්වා වූ පරාසයක තිබූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපති වරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

අ. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
ආ. ණය ගැති පාලනය
ඇ. ණය හිමි පාලනය
ඈ. අයවැය
ඉ. ස්ථාවර වත්කම්
ඊ. කොනත්‍රාත් ලපිගොණු
උ. සංයුක්ත සැලැස්ම
ඌ. මිලදී ගැනීම්